සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

ගණිතය - 4 ශ්‍රේණිය / තෙවන වාරය - සැප්තැම්බර් මාසය - 3 සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය / කේ.වී. අසංක දේශප්‍රිය අබේරත්න.

## ඒකකය 30 - ගුණ කිරීම

ක්‍රියාකාරකම 1.

- මිදුලේ රවුම් 10ක් අඳින්න.
- එක රවුමක 3 බැගින් ශාක පත්‍ර තබන්න.
- පළමු රවුමේ ඇති පත්‍ර ගණන ගණන් කර ඉදිරියෙන් ලියන්න.
- පළමු රවුමේ හා දෙවන රවුමේ ඇති කොළ ගණන ගණන් කර ඉදිරියෙන් ලියන්න.
- පළමු,දෙවන,තෙවන රවුම්වල ඇති පත්‍ර ගණන පිළිවෙළින් ගණන් කර ඉදිරියෙන් ලියන්න.
- මේ ආකාරයට රවුම් 10 ඇති පත්‍ර ගණන ගණන් කර ලියන්න.
- දැන් 3 ගුණන වගුව වැඩිහිටියෙකුගේ සහය ඇති ගොඩ නගන්න.
- මේ ආරයට 4,5,10 ගුණන වගු ගොඩ නගන්න.

(2). 2 , 3 , 4 , 5 , 10 ගුණන වගු මතකයෙන් ශබ්ද නගා කියන්න.

(3). විසඳන්න .

1.එක් මිරිස් වළක පැළ 2 බැගින් වළවල් 12 සිටුවීමට අවශ්‍ය මිරිස් පැළ ගණන කීය ද ? ________________

2.පා පැදි 25 ඇති රෝද ගණන කීය ද ? __________________

1.එක් කණ්ඩායමක සිසුන් 3 බැගින් කණ්ඩායම් 12 ක සිටින සිසුන් ගණන කීය ද ? ___________________

2. එක් අයෙකුට පොත් 3 බැගින් 35 දෙනෙකුට අවශ්‍ය පොත් ගණන කීය ද ? ____________________

1.ඉත්තතක මල් 4 බැගින් මල් ඉති 25 ඇති මල් ගණන කීය ද ? ______________________

2.කාරයක 4 දෙනෙකුට යා හැකිය . කාර් 20 කී දෙනෙකුට ගමන් කළ හැකි ද ? ________________

1.පේළියක ළමුන් 5 බැගින් පේළි 10 සිටින ළමුන් ගණන කීය ද ? ______________________

2.මල්ලක අඹ ගෙඩි 5 බැගින් මලු 22 ඇති අඹ ගෙඩි ගණන කීය ද ? ____________________

1.පාර්සලයක පොත් 10 බැගින් පාර්සල් 8 ඇති පොත් ගණන කීය ද ? ______________________

2. එක් වැලක කොඩි 10 බැගින් කොඩි වැල් 24 ඇති කොඩි ගණන කීය ද ? ________________